**ශීර්ෂය 430 - ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 22 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව,

2. **මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය කිරීම සහ ඉතිරිවීම් සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2021 සම්පූර්ණ වර්ෂය සඳහාම ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද, 2021 පෙබරවාරි 16 දිනැති අංක 2215/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉඩම් අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණි. තවද පළමු වැඩසටහනෙහි, පළමු ව්‍යාපෘතියේ වියදම් 2021 පෙබරවාරි 16 දින දක්වා පමණක් සිදු කරන ලෙස ජාතික අයවැය අධ්‍යක්ෂ විසින් 2021 මාර්තු 15 දින උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව, ඊට අදාළ පුනරාවර්තන වැය විෂයයන් 15 ක රු.27,046,825 ක්ද ප්‍රාග්ධන වැය විෂයයන් 4 ක රු.1,572,961 ක්ද ඉතිරිව පැවති අතර, එය සියයට 22 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/RE/122/09/01 හා 2021 මාර්තු 15 දිනැති ලිපියේ 3 (IV)අනුව වැය විෂය විස්තර 430-01-02 හා 430-02-03 හි කටයුතු මු.රෙ. 208 විධිවිධාන පරිදි ඉඩම් අමාත්‍යාංශය වෙත පවරා ගනිමින් ඉතිරි වියදම් දැරිය යුතු බව සඳහන් කර ඇත. ඒ අනුව 2021 මාර්තු 31 දිනට ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු අවසන් කර ඇති අතර, එදිනට ඉහත වැය විස්තර සඳහා ඉතිරි ප්‍රතිපාදන මු.රෙ. 208 විධිවිධාන පරිදි කටයුතු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය වෙත පවරා ඇත. එහෙත් 430-01-01 වැය විෂයයන් එලෙස මෙම අමාත්‍යාංශය වෙත පවරා නොමැති අතර 2021 සම්පූර්ණ වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් 2021 මාර්තු 31 දින දක්වා පමණක් පැවති රාජ්‍ය අමාත්‍යාංශය විසින් දරන ලද වියදම පමණක් (වැය විෂය 430-01-01-2003 හැර) මුළු වියදම ලෙස ගිණුම් ගත කර ඇත. | මනා සැලසුමක් මත වාර්ෂික ප්‍රතිපාදනය තීරණය කළ යුතුය. අනුමත ප්‍රතිපාදනය කාර්යක්ෂමව ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ආ) | පළමු වැඩසටහනෙහි, දෙවන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ඉඩම් අමාත්‍යාංශය වෙත පවරා ගෙන වැය දැරීම් සිදුකරන ලෙස ජාතික අයවැය අධ්‍යක්ෂ විසින් 2021 මාර්තු 15 දින උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව, ඊට අදාළ පුනරාවර්තන වැය විෂයයන් 14 ක රු. 31,787,314 ක් ද, ප්‍රාග්ධන වැය විෂයයන් 6 ක රු. 18,679,887 ක් ද ඉතිරිව පැවති | ඉහත පරිදි ඉඩම් අමාත්‍යාංශය වෙත පවරන ලද 430-01-02 වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි කිරීමට රාජ්‍ය වියදම් සමාලෝචනය සම්බන්ධයෙන් අංක 21/1596/304/134 හා 2021 අගෝස්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කර ඇති අතර, රාජ්‍ය අමාත්‍යාංශය විසින් සැලසුම් කරන ලද වියදම් එම අමාත්‍යාංශය අහෝසි වීමත් සමග ඒ ආකාරයෙන්ම දැරීමේ හැකියාවක් ලැබී නැත. තවද රට තුළ පැවති කොවිඩ් 19 වසංගතය | -එම- |

| | | | |
|---|---|---|---|
| | අතර, එය සියයට 45 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | හේතුවෙන් කාර්යාල වසා තැබීම හා නිලධාරීන් සීමා කර සේවයට ගෙන්වීම යනාදී කරුණු මත අපේක්ෂිත පරිදි සියලු වියදම් දරා නොමැති අතර අවශ්‍යතාව ඇති වන පරිදි අනෙකුත් අත්‍යවශ්‍ය වියදම් දරා ඇත. | |
| (ඇ) | දෙවැනි වැඩසටහනෙහි තුන්වන ව්‍යාපෘතිය යටතේ වූ බිම් සවිය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 500 ක් ප්‍රතිපාදනය කර තිබුණි. එසේ වුවද ඉන් රු. 240,306,000 ක් පමණක් වැය කර තිබුණු අතර, රු. 259,694,000 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | 2021 වර්ෂයේ රටේ පැවති කොවිඩ් වසංගතය හා වරින් වර කාර්යාල නිලධාරීන් නිරෝධායනයට ලක්වීම, කාර්යාල වසා තැබීම හා ක්ෂේත්‍රයට යාමට තිබූ අපහසුතාවය නිසා බලාපොරොත්තු වූ ආකාරයට ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි වූ නමුත් සත්‍ය වශයෙන් වෙන්කරගත් රු.316,000,000 මුදලින් රු. 240,306,000 ප්‍රමාණයක් එනම් සියයට 76 ක් උපයෝජනය කරගත් බව දන්වා සිටිමි. | -එම- |